
සත්‍ය කතා

# ඇත්තට ම සතුන් හිතන්නේ මොනවා ද?

**ආහාර, උණුසුම, නින්ද?.... ඔවුන් ගේ සිතුවිලි මීටත් වඩා ගැඹුරු විය හැකි ය.**



ෆූ මැන්චූ ප්‍රථම වතාවට පැන ගිය අවස්ථාවේ දී එය මිනිසුන් අතින් වූ අතපසුවීමක් යැයි සතුන්වත්තේ පාලකයන් සිතූහ. එදින සෞම්‍ය දිනයකි. 'ඔමාහා' සතුන්වත්තේ වූ වානරයන් (ඔරන්උටන්) විශාල එළිමහන් කොටුවක ක්‍රීඩා කරමින් සිටියහ. ෆූ හා ඔහු ගේ පවුල ඇත්ගාල අසල ගස්වැල්වල එල්ලෙමින් ක්‍රීඩා කරන අන්දම දුටු සතුන්වත්තේ පාලකයෝ වික්ෂිප්ත වූහ. වහා ම ක්‍රියාත්මක වූ ඔවුනට උදුන් කාමරය හා වානර කොටුව අතර ඇරී තිබුන දොර දක්නට ලැබිණ. ප්‍රධාන පාලක 'ජෙරී ස්ටෝන්ස්' සිය කාර්ය මණ්ඩලයට මහත්සේ දෝෂාරෝපණය කළේ ය. දිනෙන් දින ගත වූ අතර ජෙරී ස්ටෝන්ස්ට මේ සිදුවීම ක්‍රමයෙන් මතකයෙන් ඈත්ව ගියේ ය. උදා වූ තවත් දිනක ෆූ මැන්චූ යළිත් වරක් කූඩුවෙන් පැන ගිය අතර ජෙරී ස්ටෝන්ස් ඔහු ගේ ආවේගය පිට කළේ මෙසේ ය.

"මා සූදානම් වුණේ කාට හෝ වෙඩි තැබීමට යි."

එදා සිටම ජෙරී ස්ටෝන්ස්, ෆූ මැන්චූ ගේ නිරන්තර කටයුතු කෙරෙහි මහත් සේ අවධානයෙන් පසු වූවේ ය. ෆූ මැන්චූ වා කවුළුවෙන් වියළි අගලකට බැස්සේ ය. ඉන්පසු උදුන් කාමරයේ දොරේ පහළ කොටස අල්ලාගෙන ආපසු අදිමින් එම හිඩැසට කම්බියක් ඇතුළුකරමින් අගුල බුරුල්කොට දොර ඇරී ය. ඊළඟ දිනයේ දී ෆූ ගේ මුවෙහි වූ දිළිසෙන දෙයක් ජෙරී ස්ටෝන්ස් දුටුවේ ය. අගුල් අරිනා කම්බිය එහි විය.

**පුණ්‍යා චාන්දනී ද සිල්වා**

1968 වර්ෂයේ දී පුවත්පත් සිරස්තල ලෙසින් පළවූයේ ෆූ මැන්චූ සිරෙන් මිදීම යි. නමුත් මේ ක්‍රියාවලිය සතුන් ගේ උසස් මානසික ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු සොයමින් සිටි විද්‍යාඥයන් විස්මයට පත් කිරීමට තරම් ප්‍රමාණවත් නොවී ය. මේ කාලය වන විට වානරයන්ට මනුෂ්‍ය භාෂාවන් ඉගැන්වීමේ උත්සහයක් ද ආරම්භ වී තිබුණි. මනෝවිද්‍යාඥයින් දෙදෙනකු ස්ත්‍රී චිම්පන්සියකුට ඇමරිකානු සංඥා භාෂාවේ වචන 130 කට වැඩි ප්‍රමාණයක් ඉගැන්වීමත් සමග ම විශාල පරිවර්තනයකට මුල පිරීමක් සිදු විය. මේ ස්ත්‍රී චිම්පන්සියා 'වොෂු' නමින් හැඳින්වූවා ය. පොකුණක සිටින හංසයකු දුටු විට වොෂු 'ජලජ පක්ෂියකු' ලෙසින් සංඥා කළා ය. ඇත්තට ම වොෂු අදහස් කළේ ජලජ පක්ෂියකු විස්තර කිරීමට වූ වාක්‍ය ඛණ්ඩයක් ද? නොඑසේනම් ඇය ඉදිරිපිට ඇති දර්ශනය සම්බන්ධව වූ සංඥා පමණක් ද පිළිබඳව විද්‍යාඥයන් තුළ තවමත් එකඟතාවක් නොමැත.

'ද පැරට් ලැමිනට්' ග්‍රන්ථයේ කතුවරයා සඳහන් කරන්නේ......

"අවුරුදු ගණනාවක් තිස්සේ මා සතුන් ගේ බුද්ධිමත්භාවය පිළිබඳ පර්යේෂණ ගැන හා ඔවුන් වටා ඇති මතභේදකාරී වාතාවරණය පිළිබඳ විස්තර ලියා තිබෙනවා. මා දැක තිබෙනවා. විද්‍යාඥයන් මුහුණ දෙන ප්‍රශ්න, ඔවුන්ට අදහස් ඇති වීම හා භාෂාව පිළිබඳ ආශ්චර්යමත් දේ පරීක්ෂා කිරීමේ දී සත්‍ය වශයෙන් ම සතුන්ට සිතුවිලි එසේ නැත්නම් අප කියන අන්දමේ විග්‍රහයක් තිබෙනවා ද? සතුන් ගේ බුද්ධිමත් බව පරීක්ෂා කිරීමේ දී මීට වඩා හොඳ මාර්ග, එනම් මිනිස් සලකුණු ඉගැන්වීමේ පර්යේෂණවලට වඩා හොඳ මාර්ග ඇත්දැයි දෙගිඩියාවෙන් සිටින විට මා හට මෙය අවබෝධ විය.

එනම්, සතුන්ට සිතීමේ හැකියාව ඇත්නම් ඔවුන් ගේ එම හැකියාව වැඩිපුර ම ඔවුන් පාවිච්චි කිරීමට ඉඩ දෙන්නේ ඔවුන් ගේ අරමුණු ඉෂ්ට කර ගැනීමට මිස විද්‍යාඥයන් ඔවුන්ව සිතීමට යොමු කරන අවස්ථාවල දී නොවන බව යි.

ඒ නිසා ම මා ප්‍රවීනයන් සමග, පර්යේෂකයන් සමග හා සතුන්වත්තේ පාලකයන් සමග කථාබහ කිරීමට පටන් ගත්තා. මෙම ග්‍රහලෝකයේ ප්‍රබල ම වර්ගය වන මිනිසුන් සමග කටයුතු කිරීමේ දී බුද්ධිමත්බව පිළිබඳ නව කවුළුවක් විවෘත වී ඇති බව මගේ හැඟීම යි.

'ඔහියෝ' නගරයේ කොලොම්බස් සතුන්වත්තේ ප්‍රධාන ආරක්ෂකයා වූ වාලින් පෙන්ඩ්‍රි එක් දිනක් දුටුවේ 'කොලෝ' නැමැති ස්ත්‍රී ගෝරිල්ලා සැක සහිත දෙයක් අල්ලාගෙන සිටින බව යි. ආරක්ෂකයා ගෝරිල්ලාට රටකජු (පීනට්) දුන්නද කොලෝ ගේ බැල්ම තුළ කිසිදු හැඟීමක් නොවී ය.

එවර ඔහු අන්නාසි කැබැල්ලක් පෙන්වා සිටි අතර 'කොලෝ' ඇගේ අත දිග හැර පෙන්වා සිටියේ යතුරු දම්වැල යි. පෙන්ඩ්‍රි, කොලෝට අන්නාසි කැබැල්ලක් දුන් අතර මේ කපටි ගනුදෙනුකාරිය අන්නාසි කැබැල්ලක් ගත්තා හැම වරක ම යතුරු දම්වැලෙන් එක පුරුක බැගින් ලබා දෙන්නට අදහස් කරමින් යතුරු දම්වැලෙන් එක පුරුකක්, එවර පෙන්ඩ්‍රිට ලබා දුන්නා ය.

මේ අන්දමට ගනුදෙනු කිරීමේ ඥනය සතුනට ඇත්නම් ඔවුනට මුදල් ගනුදෙනු කළ නොහැකි ද? ටෙනසි විශ්ව විද්‍යාලයේ මානව විද්‍යාඥ ලින් මයිල්ස් විසින් සලකුණු භාෂාව පිළිබඳ ඉගැන්වීමක දී 'චැන්ටෙක්' නැමැති 'ඔරන්උටන්' මේ අභියෝගය භාර ගත්තේ මෙසේ ය. චැන්ටෙක් සිය කටයුතු නතිව ම කර ගත්තේ නම් (කාමරය පිරිසිදු කර ගැනීම) ඔහුට මුදල් උපයා ගත හැකි බව ලින් මයිල්ස් මේ ඔරන්උටන් ට ඒත්තු ගැන්වී ය. මයිල්ස් මේ සඳහා මුලින් ම භාවිත කළේ පෝකර් ක්‍රීඩාවට යොදා ගන්නා චිප්ස් (පෙති) ය. චැන්ටෙක් ඒවා දෙකඩ කරමින් ප්‍රමාණය වැඩි කිරීමට උත්සහ කළ අතර මයිල්ස් යකඩ කැබලි භාවිත කරන විට චැන්ටෙක් ලෝහ කොළ (Tin foil) කැබලි භාවිත කිරීමට හුරු පුරුදු විය. වරෙක මයිල්ස් මිදි වගයක් චැන්ටෙක්ට දී ඒවා ඔහු සමග බෙදා හදා ගැනීමට පැවසුව ද බෙදාහදා ගැනීම අමතක නොවන බව සිහිපත් කරමින් මයිල්ස් වෙතට චැන්ටෙක් ලබා දුන්නේ ඒවායේ නැටි ටික පමණි.

සතෙකුට මිනිසකු සමග සහයෝගයෙන් සිටීමට ඇති අවශ්‍යතාව කුමක් ද? චර්යාවාදීන් සඳහන් කරන අන්දමට, සතුන් සහයෝගයක් දක්වන්නේ එය ඔවුන් ගේ කැමැත්ත බව අවබෝධ කර ගත් විට යි. සත්ත්ව විද්‍යා උපදේශන ආයතනයක, සජීවී පරිසරයන් හි සත්ත්ව චර්යා පිළිබඳ විශේෂඥ ගෙල් ලෝලේ, මිනීමරු තල්මසා පිළිබඳව ඇ දන්නා දේ සඳහන් කරන්නේ මෙසේ ය.

මා දුටු බුද්ධිමත් ම සත්ත්වයා 'ඕකි' නම් තල්මසා ය. 'ඕකි' ගේ සහකාරිය 'කෝකි' දරු උපතක දී ඉතා දුර්වලව සිටියා ය. පාලකයෝ ස්ට්‍රෙචරයක ආධාරයෙන් කෝකි ජලාශයෙන් පිටතට ගත්හ.

ජලයට මීටර් කීපයක් ඉහළින් යන්ත්‍ර ක්‍රියාකරු ස්ට්‍රෙචරය නැවැත්වී ය. ළදරු තල්මසා හදිසියේ ම කටින් හා හුස්ම ගන්නා සිදුරෙන් වමනය දමන්නට ගත්හ. වමනය පෙනහලු තුළට ඇතුළු වුවහොත් 'නිව්මෝනියා' රෝගය වැළඳේ යැයි පාලකයෝ බියට පත්වූහ. එහෙත් ළදරු තල්මහට ආධාර කිරීමට මේ උදවියට ඒ අවස්ථාවේ දී හැකියාවක් නොතිබුණි. මේ වග තේරුම් ගත් 'ඕකි' වහාම ස්ට්‍රෙචරය යටට පිහිනා ගොස් එක් පුද්ගයකුට ඔහු ගේ හිස මත සිටගැනීමට අවස්ථාව ලබා දුන්නේ ය. මෙය මින් පෙර කිසිදු දිනක පුරුදු කළ හැසිරීම් රටාවක් නොවී ය. 'ඕකි' වල්ගයේ තුඩුවල ආධාරයන් නොසෙල්වී, ස්ට්‍රෙචරය ක්‍රියාකරුට ලනුපට මුදා හැරීමට හැකි වන පරිදි සිටියෙන්, කි. ග්‍රෑ. 190 ක් බරැති තල්මස් ළදරුවා ජලයට ලිස්සා යාමට සලස්වා ඌට උදව් කිරීමේ හැකියාව මිනිසුන්ට උද විණි.

**එක් දිනක් හෙලන් කෑම දෙන කවුළුව තුළින් දෙඩම් ගෙඩියක් 'මෙලට්' නැමැති ඔරන්උටන්ට දැම්මේ ය. ඔරන්උටන් එය තොගෙන හෙලන් ෂූමන් දෙස බලා අත පෑවේ පළමු දෙඩම් ගොඩියට ළං විය නොහැකි නිසාදෝ යැයි හෙලන්ට සිතුනි. නමුත් කකුල අද්දමින් ආපසු ගිය මෙලට් ළඟ පළමු දෙඩම් ගෙඩිය සඟවා ගෙන තිබෙන බව හෙලන් දුටුවා ය.**

ද්වේෂ සහිත හැසිරීම් තුළින් ද බුද්ධිමත් බවේ පැති දක්නට ලැබේ.

සීට්ල්ස් වුඩ්ලන්ඩ් පාක් සතුන්වත්තේ පාලක විසින් හෙලන් ෂූමන් ගේ මතකය අවදි කරවිය.

එක් දිනක් හෙලන් කෑම දෙන කවුළුව තුළින් දෙඩම් ගෙඩියක් 'මෙලට්' නැමැති ඔරන්උටන්ට දැම්මේ ය.

ඔරන්උටන් එය තොගෙන හෙලන් ෂූමන් දෙස බලා අත පෑවේ පළමු දෙඩම් ගොඩියට ළං විය නොහැකි නිසාදෝ යැයි හෙලන්ට සිතුනි. නමුත් කකුල අද්දමින් ආපසු ගිය මෙලට් ළඟ පළමු දෙඩම් ගෙඩිය සඟවා ගෙන තිබෙන බව හෙලන් දුටුවා ය.

මෙහි ප්‍රධාන පිරිමි සතා ටෝටන් ය. ගත වූ දින සිදුවීම ටෝටන් හොඳහැටි දුටුවේ ය. ඊළඟ දිනයේ හෙලන් පැමිණිවිට ටෝටන් ඇ දෙස බලා සිට තවමත් දෙඩම් ගෙඩියක් නොලැබුන බැව් ප්‍රකාශ කරන ඉරියව්වෙන් ම සිටියේ ය. ඔබට තවමත් දෙඩම් ගෙඩියක් ලැබුනෙ නැද්ද? හෙලන් ඇසූවිට ටෝටන් ඇය වෙත ම බැල්ම රඳවාගෙන අත පෑවේ ය. ටෝටන් පිළිබඳව ඇ සිත උපන් අනුකම්පාවෙන් දෙඩම් ගෙඩියක් දෙන විට හෙලන් දුටුවේ පළමු දෙඩම් ගෙඩිය ටෝටන් කකුල යට සඟවා ගෙන සිටි අපූරුව යි.

'පෙට් බර්ඩ් රිපෝට්' හි කර්තෘ සැලී බ්ලාන්චාඩ් සිතන්නේ සතුන්ටත් හාස්‍ය රසය තිබිය හැකි බව යි. පැකෝ නැමැති ඇමසන් ගිරවා ගේ මරණය සිදු වූවා යැයි සංවේගයක් මවා පෑ, බොන්ගො මේරි නැමැති අප්‍රිකානු අළුගිරවා පිළිබඳ වූ කථා පුවත මේ සඳහා මනා උදහරණයකි.

දිනක්, සැලී රාත්‍රි ආහාරයට කුකුළකු කැපීම සඳහා අතැති පිහිය ඔසවන විට ම "අනේ එපා.. පැකෝ" යනුවෙන් අප්‍රිකානු අළුගිරවා කෑ ගැසී ය. ඒ පැකෝ නොවන බවත් ඇමසන් ගිරවා තවමත් ජීවත්ව සිටින බවත්, සැලී "බොන්ගො මේරි" නම් අළු ගිරවාට ඒත්තු ගැන්වී ය. එවිට අළු ගිරවා අසතුටු ස්වරයෙන් 'අනේ... එපා... යැයි පවසා උමතුව හඬ නගන්නට වූවා ය.

මෙහි දී කුරුල්ලා මැරුණ බව විශ්වාස කළ බවට විහිළුවක් කළා ද? නැත්නම් සැලී ගේ ප්‍රතික්‍රියාව දැන සිටියා ද? යන පරීක්ෂණ වලින් දැනට සනාථව ඇත්තේ අප්‍රිකානු අළු ගිරවුන්ට වචන තේරෙන බව යි.

නිදසුනක් ලෙස 'රතු' යනුවෙන් හඳුන්වන්නේ පාටක් මිස යම්කිසි රතුපාට දෙයක් නොවන බව ගිරවුන්ට තේරෙන බව යි. මානව ප්‍රතික්‍රියාවන් පිළිබඳව ගිරවුන් ද රසවිඳින වග 'බොන්ගො මේරි' ගේ සිද්ධිය තුළින් පැහැදිලි වනවා ඇත.

සත්‍ය වශයෙන් ම ඥනය යනු කුමක් ද? ජීවිතය කියන්නේ වර්ගයා ගේ පැවැත්ම නම්, ඥනවන්ත බව මේ පැවැත්මට උදව් වනවා නම් අපව ගොදුරු කර ගත් ඩයිනෝසරයන් සහමුලින් ම විනාශ කළ ව්‍යසනයෙන් බේරුණු බුද්ධියෙන් අඩු මුහුදු කැස්බෑවන්ට අපව සම කළ නොහැකි ය.

මිනිසා හැර වෙනත් වර්ගයන්ට ද අවට ඇති ලෝකය සීමාසහිත වුව ද එය ස්වශක්තියෙන් තේරුම් ගැනීමට හැකි වීම එක්තරා අන්දමක සහනයකි.

**'ඉයුජින් ලින්ඩෙන්' විසින් 'රීඩර්ස් ඩයිජස්ට්' සඟරාවට සැපයූ ලිපියක් ඇසුරෙනි.**